කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2022

2025 - ජුලි

**BCOM E 4025 - මූල්‍ය ගිණුම්කරණය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතයි : (07) කාලය : පැය 03 යි

පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

අ) i. මූල්‍ය කළමනාකරණ දෘෂ්ටිකෝණයෙන් සමාගමක ප්‍රධාන ඉලක්කය කුමක්ද?

(ලකුණු 02)

ii. සමාගමකට එය මැනිය හැකි ආකාරය පැහැදිලි කරන්න

(ලකුණු 03)

ආ) "මූල්‍ය කළමනාකරුගේ කාර්යභාරය වන්නේ සෞඛ්‍ය සම්පන්න ශේෂ පත්‍රයක් නිර්මාණය කිරීමයි". මූල්‍ය කළමනාකරු විසින් ගනු ලබන විවිධ තීරණ මත පදනම්ව ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) මුදලේ කාල අගය යනු කුමක්ද? එය වැදගත් වන්නේ ඇයි?

(ලකුණු 05)

ආ) ඔබ ඔබේ ඉතුරුම් රු. 300,000 ක් සිලෝන් බැන්ක් පීඑල්සී හි ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට සැලසුම් කරයි. බැංකු කළමනාකරු ඔබට පහත අනුපාත ලබා දී ඇත.

- මාසිකව 6% සංයුක්ත වේ
- මාස 3 කින් 6% සංයුක්ත වේ
- මාස 6 කින් 7% සංයුක්ත වේ
- වාර්ෂිකව 7% සංයුක්ත වේ

i. ඉහත විකල්ප අනුපාත යටතේ ඔබේ ඉතුරුම් ආයෝජනය කිරීමට ඔබ තෝරා ගන්නේ කුමන විකල්පයද?

(ලකුණු 02)

ii. ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ඇ). කාංචන මහතා සමාන පිරිවැයකින් යුතු වාර්ෂිකය A සහ වාර්ෂිකය B යන මුදල් ප්‍රවාහ දෙකෙන් වඩා හොඳ එකක් තෝරා ගැනීමට බලාපොරොත්තු වේ: A යනු වසර 5 ක් රු. 90,000 ක මුදල් ප්‍රවාහයන ලැබෙන හිග හිටි වාර්ෂිකයකි. B යනු රු. වසර 5 ක් සඳහා රු. 100,000ක් ලැබෙන සාමාන්‍ය වාර්ෂිකයකි. කාංචන මහතාට ඔහුගේ ආයෝජන වලින් 15% ක් උපයා ගත හැකි යැයි උපකල්පනය කරන්න.

i. වාර්ෂික A සහ වාර්ෂික B යන දෙක සඳහා 5 වන වසර අවසානයේ අනාගත වටිනාකම සොයන්න.

(ලකුණු 06)

ii. කුමන වාර්ෂිකය වඩාත් ආකර්ශනීයද? ඇයි?

(ලකුණු 03)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 03**

අ) ආයෝජකයින් සඳහා මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය වැදගත් වන්නේ ඇයි?

(ලකුණු 04)

ආ) මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය කිරීමට විවිධ මෙවලම් භාවිතා කළ හැකිය. තිරස්, සිරස් සහ අනුපාත විශ්ලේෂණය ඒ සඳහා උදාහරණ වේ. සුදුසු උදාහරණ සමඟ මෙම ශිල්පීය ක්‍රම පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ) 2025 මාර්තු 31 සහ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර දෙක සඳහා නෝවා පීඑල්සී හි ආදායම් ප්‍රකාශයන් සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයන්ගෙන් උපුටා ගත් කොටස් පහත දැක්වේ.

නෝවා පීඑල්සී
2025 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා
ආදායම් ප්‍රකාශය

(රු. '000)

| විස්තර | 2025 | 2024 |
|---|---|---|
| විකුණුම් | 56,800 | 46,950 |
| විකුණුම් පිරිවැය | (45,300) | (38,400) |
| දළ ලාභය | 11,500 | 8,550 |
| මෙහෙයුම් වියදම් | (5,420) | (4,200) |
| මෙහෙයුම් ලාභය | 6,080 | 4,350 |
| වෙනත් ආදායම් | 1,150 | 890 |
| පොළී වියදම් | (850) | (640) |
| බදු පෙර ලාභය | 6,380 | 4,600 |
| ආදායම් බදු | (1,870) | (1,300) |
| බදු පසු ලාභය | 4,510 | 3,300 |

නෝවා පීඑල්සී
මාර්තු 31 වන දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය (උපුටා ගැනීම)
(රු. '000)

| විස්තර | **2025** | **2024** |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | 15,600 | 10,200 |
| ආයෝජන | 6,500 | 1,050 |
| **ජංගම වත්කම්** | | |
| තොගය | 580 | 390 |
| වෙළඳ ලැබිය යුතු දෑ | 5,220 | 4,150 |
| වෙනත් ජංගම වත්කම් | 2,640 | 1,790 |
| මුදල් සහ බැංකු | 5,300 | 4,850 |
| **මුළු වත්කම්** | **35,840** | **22,430** |
| **ප්‍රාග්ධනය සහ වගකීම්** | | |
| සාමාන්‍ය කොටස් | 10,750 | 6,800 |
| රඳවා ගත් ලාභ | 6,600 | 2,150 |
| **දිගු කාලීන ණය** | 920 | 640 |
| **ජංගම වගකීම්** | | |
| ගෙවිය යුතු දෑ | 10,450 | 8,050 |
| උපචිත වියදම් | 7,120 | 4,790 |
| **මුළු ප්‍රාග්ධනය සහ වගකීම්** | **35,840** | **22,430** |

අවශ්‍ය වන්නේ:

ඉහත දක්වා ඇති තොරතුරු භාවිතා කර 2025 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පහත අනුපාත ගණනය කරන්න:

i. ජංගම අනුපාතය
ii. ක්ෂණික අනුපාතය
iii. දළ ලාභ අනුපාතය
iv. ශුද්ධ ලාභ අනුපාතය
v. තොග පිරිවැටුම් අනුපාතය

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 04**

අ) හොඳ ආයෝජන තීරණ ගැනීමේදී ආයෝජකයින්ට සුරකුම්පත් අගය කිරීම වැදගත් වන්නේ ඇයි? පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ) සමාගමක ප්‍රාග්ධන පිරිවැයට බදු බලපාන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ඇ) ජයමග සමාගම එහි ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා මුදල් සපයාගන්නේ කොටස් සහ ණය ප්‍රාග්ධනයේ එකතුවක් මගින් වන අතර, ප්‍රාග්ධන ව්‍යුහය, 55% සාමාන්‍ය කොටස්, 25% වරණීය කොටස් සහ 20% ණය වලින් සමන්විත වේ. සමාගමේ ප්‍රාග්ධන සංරචක පිළිබඳව තොරතුරු පහත පරිදි වේ.

- **<u>සාමාන්‍ය කොටස්:</u>**

- සමාගම මෑතකදී රු. 25/- ක ලාභාංශයක් ගෙවීය.
- ඉදිරි වසර දෙක සඳහා ලාභාංශ වාර්ෂිකව 16% කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර, පසුව 10% ක ස්ථාවර වර්ධන අනුපාතයක් අනන්තයක් දක්වා පවතින බවට බලාපොරොත්තු වේ.

- **<u>වරණීය කොටස්:</u>**

- රු. 150/- ක මුහුණත වටිනාකමකින් නිකුත් කරන ලද අතර, අනන්තයක් සඳහා වන ලාභාංශ අනුපාතය 20% කි.

- **<u>ණය:</u>**

- මුහුණත වටිනාකම: රු. 100/-
- කූපන් අනුපාතය: 10% (අර්ධ වාර්ෂික ගෙවීම්)
- කල්පිරීමේ කාලය: අවුරුදු 10.

ජයමග පීඑල්සී සමාගම සඳහා සාමාන්‍ය කොටස්, වරණීය කොටස් සහ ණය සඳහා පිරිවැය පිළිවෙලින් 18%, 15% සහ 12% ලෙස උපකල්පනය කරන්න.
මෙම තොරතුරු මත පදනම්ව, පහත සඳහන් දෑ ගණනය කරන්න:

i. සාමාන්‍ය කොටස්වල නෛසර්ගික වටිනාකම

(ලකුණු 03)

ii. වරණීය කොටස්වල නෛසර්ගික වටිනාකම

(ලකුණු 02)

iii. බැඳුම්කරවල නෛසර්ගික වටිනාකම

(ලකුණු 03)

iv. සමාගම සඳහා බර තැබූ සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය (WACC)

(ලකුණු 03)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 05**

a) සමාගමක අගය සහ එහි ප්‍රාග්ධන ව්‍යුහය අතර සම්බන්ධතාවය නිදර්ශනය කරන්න.

(ලකුණු 07)

b) විවිධ ව්‍යාපාරික තත්වයන් යටතේ වැරෙක්ස් සමාගම පහත ප්‍රතිලාභ ප්‍රක්ෂේපණය කර ඇත:

| ව්‍යාපාර තත්ත්ව | සම්භාවිතා | ප්‍රතිලාභ |
|---|---|---|
| දුර්වල | 0.25 | -8% |
| සාමාන්‍ය | 0.6 | 6% |
| ශක්තිමත් | 0.15 | 18% |

i. ඉහත දත්ත භාවිතා කරමින්,වැරෙක්ස් සමාගම සඳහා පහත සඳහන් දේ ගණනය කරන්න

(i) අපේක්ෂිත ප්‍රතිලාභය

(ලකුණු 03)

(ii) සම්මත අපගමනය (අවදානම)

(ලකුණු 03)

ii. ආයෝජකයෙකු තම ආයෝජන කළඹෙන් 65% ක් සෙන්ටෙක් සමාගමේත්, 35% ක් ඕවැක්ස් සමාගමේත් ආයෝජනය කර ඇත. සමාගම් දෙකෙහි බීටා අගය 0.7 ක් වන අතර, කොටස් දෙකම ධනාත්මක සහසම්බන්ධ වේ. පහත විස්තර සපයා ඇත

- සෙන්ටෙක් සමාගම (ERz) හි අපේක්ෂිත ප්‍රතිලාභය = 16%
- ඕවැක්ස් සමාගම (ERo) හි අපේක්ෂිත ප්‍රතිලාභය = 12%
- සෙන්ටෙක් සමාගම (σz) හි සම්මත අපගමනය = 20%
- ඕවැක්ස් සමාගම (σo) හි සම්මත අපගමනය = 18%

ඉහත දත්ත භාවිතා කරමින්,පහත දෑ ගණනය කරන්න

(i) ආයෝජන කළඹේ තිලාභය

(ලකුණු 03)

(ii) ආයෝජන කළඹේ සම්මත අපගමනය (අවදානම).

(ලකුණු 04)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 06**

අ) මූල්‍ය කළමනාකරණයේදී ප්‍රාග්ධන අයවැය තීරණවල වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 03)

ආ) අන්‍යෝන්‍ය වශයෙන් බහිෂ්කාර ව්‍යාපෘතිවලින් ස්වාධීන ව්‍යාපෘති වෙන්කර දක්වන්න

(ලකුණු 04)

ඇ) ඕරිකා පුද්ගලික සමාගම ඔවුන්ගේ නව නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා විකල්ප දෙකක් ඇගයීමට ලක් කරයි: සමාජ මාධ්‍ය තුලින් ප්‍රචාරණ ව්‍යාපෘතියක් සහ රූපවාහිනී ප්‍රචාරණ ව්‍යාපෘතියක්. එක් එක් විකල්පය සමඟ සම්බන්ධ ශුද්ධ මුදල් ප්‍රවාහ පහත දැක්වේ. ප්‍රාග්ධනයේ පිරිවැය 11% කි. (සියලුම අගයන් රු. 000 න් දක්වා ඇත)

| ප්‍රවර්ධන ව්‍යාපෘතිය | | ප්‍රචාරණ ව්‍යාපෘතිය | |
|---|---|---|---|
| වසර | මුදල් ප්‍රවාහ | වසර | මුදල් ප්‍රවාහ |
| 0 | (140,000) | 0 | (120,000) |
| 1 | 40,000 | 1 | 40,000 |
| 2 | 55,000 | 2 | 45,000 |
| 3 | 75,000 | 3 | 50,000 |
| 4 | 90,000 | 4 | 80,000 |
| 5 | 110,000 | 5 | 100,000 |

ඉහත දත්ත භාවිතා කරමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. විකල්ප දෙකටම පිළිගෙවුම් කාලය ගණනය කරන්න

(ලකුණු 04)

ii. විකල්ප දෙකටම ශුද්ධ වර්තමාන වටිනාකම ගණනය කරන්න

(ලකුණු 06)

iii. ඔබේ විශ්ලේෂණය මත පදනම්ව, සමාගම තෝරා ගත යුත්තේ කුමන ආයෝජන විකල්පයද? හේතුව පැහැදිලි කරන්න.

(ලකුණු 03)

**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 07**

අ) කාරක ප්‍රාග්ධන කළමනාකරණය නිර්වචනය කරන්න

(ලකුණු 03)

ආ) මෙහෙයුම් චක්‍රය උදාහරණයක් සමඟ කෙටියෙන් පැහැදිලි කරන්න

(ලකුණු 07)

ඇ) "වත්මන් ලාභාංශ සම්බන්ධයෙන් සියලුම කොටස් හිමියන්ට එක හා සමාන කැමැත්තක් නොමැති අතර, සියලුම සමාගම් වත්මන් ලාභාංශ ගෙවීමට ප්‍රමුඛත්වය නොදක්වයි." ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(ලකුණු 05)

ඇ) "ලාභාංශයක් යනු කොටස් හිමියන් අතර බෙදා හරින ලද ශුද්ධ ලාභයෙන් කොටසකි. සමාගමක ලාභාංශ තීරණය අතිශයින් වැදගත් වන අතර, ලාභාංශ තීරණ සමාගමේ වටිනාකමට බලපාන ආකාරය පිළිබඳව පරස්පර අදහස් තිබේ." ලාභාංශ න්‍යායන් ඇසුරෙන් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

**(මුළු ලකුණු 20)**